# සිංහල භාෂාව හා සාහිත්‍යය

2024-06

10 ශ්‍රේණිය

පැය 1 යි.

නම ........................................................ පන්තිය ........................ අංකය ........................

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්න වලට එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

1. වීරසුන්දර මහතා ඉදිරියට පැමිණ **සුදු හුණු ගෑමට** පටන් ගත් නිසා සියල්ල වෙනස් විය.

   i. වැරදි පිළිබඳ විමසීමට
   ii. නිවැරදි තතු විමසීමට
   iii. වැරදි වසන් කිරීමට
   iv. සුදුපාට පින්තාරු කිරීම

2. **දවල් හීන බල බලා** සිටීම නිසා සමහර දරුවෝ කාලයෙන් උපරිම ප්‍රයෝජන නොගනිති.

   i. සමහර විට ඉටු විය හැකි දේවල් ගැන සිතීම
   ii. දවල් කාලය තුළ අනිවාර්යෙන් ඉටුවන දේවල් ගැන සිතීම
   iii. කිසිදා ඉටු නොවන දේවල් ගැන සිතීම
   iv. අනාගතයේදී ඉටුවන දේවල් ගැන සිතීම

3. **කවදත් ඇඟ බේරාගැනීමට** හපනෙකු වූ ධනදාස මෙවරත් සමිතියේ සාමාජික මුදල් නොගෙවීය.

   i. ඉතා සාර්ථකව වැඩ කිරීමට
   ii. උපායශීලීව මඟ හැරීමට
   iii. කාටත් නොපෙනෙන සේ සිටීමට
   iv. අනුන් නොරවටන ක්‍රියා කොට

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්න වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. සරච්චන්ද්‍ර මහතාගේ ..................................... විෂය විෂයාන්තර වශයෙන් කැපී පෙනේ.

   i. ශාස්ත්‍රානුකූලත්වය
   ii. ශාස්ත්‍රාභිලාෂී බව
   iii. ශාස්ත්‍රධරත්වය
   iv. ශාස්ත්‍රෝක්ත බව

5. රජයෙන් මහජනයාට ඉටු විය යුතු ..................................... සේවයක් නම් සමාජ සුභසාධන කටයුතු ඉටු කිරීමයි.

   i. විකල්ප
   ii. විශ්වාසනීය
   iii. විශිෂ්ටතම
   iv. අයෝමය

6. සෞඛ්‍ය අමාත්‍යතුමා ජාතික ඖෂධ ..................................... මෙරටට හඳුන්වා දුන්නේය.

   i. ප්‍රතිපත්තියක්
   ii. ප්‍රස්තුතයක්
   iii. ප්‍රතිසංවිධානයක්
   iv. ප්‍රලේඛනයක්

7. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

   i. ග්‍රහනය , සන්ධාර , මරණවා , අරමුණු
   ii. ලහිරු , සමතුලිත , නිශ්ශබ්ද , කනිෂ්ය
   iii. මාළුවා , සිසුපෙළ , ඇතුළත , සියලු
   iv. පුස්ථකාලය , නිෂ්පල , විමෂර්ණ , ශිෂ්‍ය

8. පහත සඳහන් පදවල මුල් අක්ෂරයෙහි අනුපිළිවෙලින් රකාරංශය , දීර්ඝ පාපිල්ල , කෙටි ඉස්පිල්ල , ඇලපිල්ල දී ඇති වරණය තෝරන්න.

   i. ක්‍රමය , සූකිරි , පාරුව , දිගටි
   ii. නූගත් , සිහිනය , ත්‍රිපිටකය , ආදරය
   iii. ත්‍රෛනිකායික , රූමත් , කිරි ඉබ්බන්ආර , බාලයන්
   iv. ත්‍රෛමාසික , පාලනය , පූරක , පිහිය

De Mazenod College Kandana — Resource R

9. පද දෙකෙන් එක් පදයක පමණක් අර්ථයක් ඇති යුගල පද සහිත පද පේළිය තෝරන්න.

i. අඩිපුඩි , ඔප්පු තිරප්පු , ඉඳුම් හිටුම් , හඳි හූනියම්
ii. ගමේ ගොඩේ , ගෙදර දොරේ , ඉඳුම් හිටුම් , හඳි හූනියම්
iii. තක්කු බුක්කු , අත්පුඩි , ඉඩම් කඩම් , නහින දෙහින
iv. අඩුම කුඩුම , හුරු පුරුදු , ඉහින් කනින් , තුටු පඩුරු

10. අනුක්ත නාම පද පමණක් ඇති වරණය තෝරන්න.

i. ගුරින් , වඳුරන් , ඇතැමෙකු , අපි
ii. උගත්තු , වියතුන් , දරුවෝ , මව
iii. අයෙකු , කුරුල්ලෙකු බලන් , අප
iv. ලේඛිකාවෝ , පියවරු , පියා , අඟනක

11. උපසර්ග පදයක් රහිත පදයක් ඇති වරණය කුමක් ද ?

i. සුබැසි , අනුදැන , පගා , පස්
ii. සුජාත , සම්පත්ති , අනුරූ , දුගඳ
iii. අබිසෙස් , විමල , උපකාර , ප්‍රබන්ධ
iv. අදියර , නිදෙර්ෂි , ප්‍රලෝභ , ප්‍රතික්‍රියා

12. ළමයි බුදුන් **වැඳ** නින්දට යති . මෙහි ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ ,

i. විධි ක්‍රියා
ii. පූර්ව ක්‍රියා
iii. අපර ක්‍රියා
iv. මිශ්‍ර ක්‍රියා

• අංක 13 සිට 15 තෙක් ඇති ප්‍රශ්න වල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය නිවැරදිව දී ඇති වරණය තෝරන්න.

13. **සින්දු සමාන** වැව් තලා මතින් ඇදී ,

i. සින්දු නදියට සමාන
ii. විශාල වැවකට සමාන
iii. ගීතයකට සමාන
iv. සාගරය හා සමාන

14. ශ්‍රී ලංකාවේ ඉතා **දුර්ලභ** ශාක විශේෂ ඇත.

i. පහසුවෙන්ම සොයා ගත හැක
ii. සැම තැනකින්ම සොයා ගත හැක
iii. වඳ වී ගෙන යන
iv. දුවර්ල කඳ සහිත ශාක

15. භාෂා **කුසලතාවය** සාහිත්‍ය කරුවෙකුට අවශ්‍යමය.

i. දැනුම
ii. ප්‍රවීණත්වය
iii. හැදෑරීම
iv. පරිශීලනය

16. දී ඇති ආකාර ගැලපීමෙන් සකසා ගත හැකි ග්‍රන්ථ නාමය නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?

i. ත ර න් යු ගා ය
ii. ලි ය ක යු ග
iii. අ ම ග ගේ පේ
iv. පෙ ළි ග ය ම් ගෙ ර

17. මුලින් දී ඇති ක්‍රියා වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

i. අසම්භාව්‍ය ක්‍රියා - ආවොත් , යද්දී , සිටිද්දී , දුවද්දී
ii. ආශිර්වාද ක්‍රියා - ලැබේවා , වේවා , නැසේවා , දිනේවා
iii. විධි ක්‍රියා - කරව , යව , බලන්න , ගනු
iv. මිශ්‍ර ක්‍රියා - දුවමින් , පැන පැන , කරමින් , යමින්

18. පහත දී ඇති වචන අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට බැඳී පවතින වචන පමණක් ඇති පද සහිත පේළිය තෝරන්න.

i. කුරුළු පාළුව , දියවර , බෙත්ම , මඩතාවුල්ල
ii. දුමන , කෙරී කරනවා , කම්මැළි අංගේ , කිරි කැකුළි
iii. මාළු අයින , ලෙල්ලම , හැන්නදි රාළ , ලියන්නාව
iv. අම්බරුවා , කයිබත , බරු බැත , උප්පු

19. පහත පද පේළි තුළින් සමානාර්ථ පද යුගලයක් ඇතුළත් නොවන පද යුගලයක් සහිත වරණය තෝරන්න.

i.පැණි - මධු , පුස්තක - ග්‍රන්ථ , අභිමත - කැමති , පේ‍්‍රමාව - මාතෘකාව

ii.ලිපිය - ලියුම , වාක් - වචන , පද්‍ය - පැදි , මාධ්‍ය - මැදුම්

iii.චින්තනය - සිත , නෛපුන්‍ය - දක්ෂ , අනගි - අගනා , නිතර - නීති

iv.හසළ - නිපුණ , නයන - ඇස් , උක්තින් - කියමන් , අංග - කොටස්

20. විරුද්ධාර්ථ පද යුගලයක් නොවන්නේ මින් කුමන වරණය ද ?

i. අනිවාර්ය - අනුරූප

ii. සුගම - දුගම

iii. පුරපස - අවපස

iv. සංග්‍රහ - නිග්‍රහ

21. මුලින් දී ඇති පදයට සමානාර්ථ පද පමණක් නොමැති වරණය තෝරන්න.

i. වස්ත්‍ර - පිළ , පට , සේල , වස්තු

ii. සුගත - බුද්ධ , මුනිඳු , තිලෝනා , භගවා

iii. අකුරු පටුන - අක්ෂර මාලාව , වර්ණ මාලාව , අකුරු වැල , හෝඩිය

iv. කනා - කනක , කාංචන , කසුන් , හේම

22. නිවැරදි අදහස සහිත වරණය මේ අතරින් කුමක්ද ?

i. ය , ව - අර්ධ නාසිකය අක්ෂරයි

ii. ශ , ෂ , ස - අල්පප්‍රාණ උෂ්මාක්ෂරයි

iii. ණ , න , ම - වර්ගාන්ත අක්ෂරයි

iv. ඨ , ට - මූර්ධජ අක්ෂර වේ

23. තාලුජ අක්ෂරයකින් ආරම්භ වන පද සහිත වරණය කුමක් ද ?

i. චාමර , ජය , ජවි , ධරණී

ii. ඣාණය , ජටාව , ඡන්දය , චරිතය

iii. නදන , තවම , චතුර , ජලය

iv. ධූම , දූරය , නන්දන , ජනයා

24. යුගල පදයක් රහිත පදයක් ඇති වරණය තෝරන්න.

i. කසු කුසු , අටු කොටු , අනත් මනත් , අඩි පුඩි

ii. මව් පියෝ , ගහ කොළ , වැල මිට , ඉර හඳ

iii. උස් මිටි , දුක සැප , හදා වඩා , අවි ආයුධ

iv. අඩු පාඩු , ඇත්ත නැත්ත , නගින දෙගින , කියුම් කෙරුම්

25. පහත සඳහන් ප්‍රස්තා පිරුලෙහි හිස් තැනට සුදුසු වචනය තෝරන්න.
කන්දක් වීලිලා .................................... වැදුවා වගේ

i. කොට් පැටියෙක්

ii. මී පැටියෙක්

iii. හා පැටියෙක්

iv. දරු පැටියෙක්

26. තද කළු අකුරින් මුද්‍රිත ඉඟි වැකියේ අදහස දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
<u>රජ මාළිගේ පරවියා වගේ</u> - ජිවිතේ මගේ අපි ගෙවනවා ඔහේ

i. තැනින් තැන යමින් ජිවත් වීම

ii. වැරදි කරමින් ජිවත් වීම

iii. ඉතා සැහැල්ලුවෙන් ජිවත් වීම

iv. බයෙන් සැකෙන් ජිවත් වීම

27. “ අ ” “ ආ ” කොටස් දෙක නිවැරදිව ගැලපීමේ ලැබෙන නිවැරදි පිළිතුර කුමක්ද ?

| අ | ආ |
| --- | --- |
| • ක)කල දුටු කල වල ඉහ ගැනීම | අ ) ප්‍රස්තා පිරුලකි |
| • ච)රවුම් ගෙරවුම් | ආ ) ආප්තෝපදේශයකි |
| • ට)කනා ඉරේ පාට කීම | ඇ ) ඉඟි වැකියකි |
| • ත)ඉවසීමෙන් සැනසීම ලැබේ | ඈ ) යුගල පදයකි |

I. ක ,ඈ II. ත,ආ III. ච,අ IV. ට,ආ

• 28 , 29 , 30 , 31 යන ප්‍රශ්න වල ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

28.
i. මා ඔවුන් හා ගෙදර ගියෙමි
ii. කාන්තාවක දරුවෙක් නළවයි
iii. ගුරුවරු ද , ශිෂ්‍යයොද පාසලෙහි සිටිති
iv. මම දරුවෙක් සමග වැඩෙහි යෙදෙමි

29.
i. අයියා හෝ මම ගෙදර යමු
ii. මිනිස් කැල රට ගොඩ නගයි
iii. තරු පංති අහස කළු කරයි
iv. මම ද නංගි ද ගෙදර යමි

30.
i. ඕ තොමෝ ගෙදර යති
ii. විවිධ වාක්‍ය රීතීහු බස පෝෂණය කළේය
iii. බිඟු කැල ගුමු ගුමු නද දුන්නේය
iv. මැති ගණ සබයට එයි

31.
i. ඔවුහු දහම් ඇසුවෝය
ii. හිමි පා වෙහෙරට වඩියි
iii. ඔවුහු ද නුඹ ද සතුටින් සිටිති
iv. නුඹ නැතහොත් මම පන්සලට යයි

• අංක 32 සිට 33 දක්වා දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩා ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

32. ගින්නක් නැතුව දුමක් නොනගී
හේතුවක් නැතුව කිසිවක් සිදු නොවේ
i. සියලු දේ සඟවා තබා ගත නොහැකි වේ
ii. සත්‍යය කවර දා හෝ ජය ගනු ඇත
iii. සැකය නිසා විනාශයට පත් වේ

33. උඩ පැන්නොත් බිම වැටේ
i. කරදර පිට තවත් කරදර ඇති වීම
ii. උඩගුකමින් කටයුතු කිරීම නිසා විපතට පත් වීම
iii. බයකින් සැකයකින් තොරව කටයුතු කිරීම
iv. තමන්ට නුපුරුදු කාර්යයක් කිරීමට ගොස් අමාරුවේ වැටීම

34. " කුඩා කල දී ම අනාගතය පිළිබඳ යහපත් ලකුණු දැකිය හැකිය " යන්නට යෙදිය හැකි ප්‍රස්තාව පිරුළ තෝරන්න.
i. යන යකා කොරහත් බිඳගෙන යනවලු
ii. ඉබ්බා දියට දැම්මා වගේ
iii. හැදෙන ගහ දෙපැත්තෙන් දැනේ
iv. ගල හොඳ නම් අඹරන කහ මක් වේද ?

35. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
" මාත් එක්ක ඔක්කොමලා ගෙදර ගියා "
i. මා සමග සියලු දෙනා නිවසට ගියහ
ii. මම සමග සියලු දෙනා නිවසට ගියෝය
iii. මා සමග සියලු දෙනා නිවසට ගියේය
iv. මං සමග සියලු දෙනා නිවසට ගියේය

36. " අර මිනිස්සුන්ටත් වතුර කිබහ ඇති . තේ ටිකක් දුන්නොත් නරක ද ? "
මෙහි ඇතුළත් නොවන විරාම ලක්ෂණය තෝරන්න.
i. තනි උඩු කොමාව
ii. ප්‍රශ්නාර්ථ ලකුණ
iii. තිත
iv. යුගල උඩු කොමා

37. මෙහි ( අ ) , ( ආ ) කොටස් යටතේ දැක්වෙන සංඛ්‍යා නාම ගණනින් එකිනෙකට ගැළපූ විට නිවැරදි වරණය වන්නේ,

| ( අ ) | ( ආ ) |
|---|---|
| P - අටළොස් | T – 16 |
| Q - සොළොස් | U – 84 |
| R - සුවිසි | V – 18 |
| S - සුවාසූ | W – 24 |

i. P W    ii. Q U    iii. R V    iv. S U

2024.06
G.10

38. “ නැතිව ” යන්නට “ නැතුං ” සේ යෙදෙන්නේ

i. දකුණු ප්‍රදේශයේ
ii. උඩරට ප්‍රදේශයේ
iii. මොනරාගල ප්‍රදේශයේ
iv. ඌව ප්‍රදේශයේ

39. පියාගේ වැඩිමහල් සහෝදරයා හැඳින්වීමට යෙදෙන පදයක් නොවන පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

i. මහප්පා
ii. කුඩප්පා
iii. බක්කප්පච්චි
iv. ලොකු අප්පච්චි


40. හිස්තැන්වලට ගැළපෙන යුගල පද නිවැරදි ව දී ඇති වරණය තෝරන්න.

“ අවුරුදු චාරිත්‍ර ................... හරියටම ඉෂ්ට ................... කරන්න ඕනෑ.

ගෙවල් ................. සුද්ද ................... කරලා හිටිමුකෝ කලින් ම ”

i. චාරිත්‍ර , නිෂ්ට , දොරවල් , බද්ද
ii. චාරිත්‍ර , සිද්ධ , දොරවල් , බද්ද
iii. චාරිත්‍ර , සිද්ධ , දොරවල් , බුද්ද
iv. චාරිත්‍ර , අනිෂ්ට , දොරවල් , බද්ද

Learning Resource Cent...
R
De Mazenod Coll...


Department of Education - Western Province
උත්තර පත්‍රය / ANSWER SHEET

2024 . 06 .

21 | s | I

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana

# ද මැසිනොද් විදුහල - කඳාන

# De mezenod college - kandana

## පළමු වාර පරීක්ෂණය

## 2024

**සිංහල භාෂාව හා සාහිත්‍ය II**

කාලය පැය 2.යි

නම ........................................ පන්තිය .................... අංකය ..............

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස් වලට කෙටි පිළිතුරු ලියන්න. නොලියන කොටස් ඇත්නම් එහි අංකය ලියා ඉරක් අදින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇති අර්ධස්වර හතර ලියන්න..........................................

(ii) පහත දැක්වෙන පාඨයෙන් උපසර්ග සහිත පද දෙකක් උපුටා ලියන්න.

"සාමාන්‍ය ඇතුන්ගේ අඩි සලකුණු අතර, සුවිශේෂ විසල් අඩි සලකුණු දුටුවහොත් මා අනිවාර්යයෙන් ම හඹා යන්නේ ඒ විසල් අඩි සහිත හස්ති රාජයාය."

..........................................................................................

..........................................................................................

(iii) මොනරාගල ප්‍රදේශයේ භාවිතවන පහත සඳහන් පද සඳහා පොදු ජන වහර ලියන්න.

(අ) කොකිස් - .................................... (ආ) කුදහනවා - ....................................

(iv) පහත දැක්වෙන නාම පදවල ප්‍රකෘති වෙන් කොට දක්වන්න.

(අ) ගොවියා - .................................... (ආ) යතුර - ....................................

(v) කප යන ධාතු ප්‍රකෘති ඇසුරෙන් පහත සඳහන් ක්‍රියා පද වගර් ගොඩනගන්න.

(අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා - .................................... (ආ) විධික්‍රියා - ....................................

(vi) පහත දැක්වෙන වචන සඳහා යෙදෙන සමානාරර පදය බැගින් ලියන්න.

(අ) මළුව - .................................... (ආ) ස්තූපය - ....................................

(vii) පහත සඳහන් ඉඟිවැකි මඟින් පළවන අර් ථය ලියා දක්වන්න.

(අ) මුනේ දලිගෑවා- .................................... (ආ) ඉහේ මලක් පිපුනා - ....................................

(viii) පහත සඳහන් අදහස් වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(අ) පිහිට පතා ගිය තැනකින් විපතක් සිදුවීම - ....................................

(ආ) අධමයන්ට උතුම් දෙයක් පලක් නැති කම - ....................................

(ix) පහත සඳහන් පාඨයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

" නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල බුක්ති විඳින සෑම පුරවැසියෙක්ම එතුමාට ණය ගැති වෙයි."

.................................................................................................................................

(x)පහත සඳහන් අනුක්ත පදවලට උක්ත රූප ලියා දක්වන්න.

(4) කාර්මිකයකු - ..........................................................................

(ආ) ඔවුන් - ..........................................................................

(ලකුණු 2x10-20)

(02) පහත දැක්වෙන (අ) (ආ). (ඉ). (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

I. ක්‍රීඩාව කායික මෙන්ම මානසික සුවතාවය ද ඇති කරයි. අතීතයේ මිනිසා වෘත්තිය ජීවිතයෙන් තම සිරුරට ලබාදුන් ව්‍යායාම අද වන විට බලෙන් සිරුරට ලබා දීමට සිදුව ඇත. සමාජීය ජීවිතය පෝෂණය කිරීමට ද, පෞරෂවර්ධනයට ද ක්‍රීඩාවෙන් ඇති කරන * බලපෑම සුළුපටු නොවේ අද ළමා පරපුර පරිගණක ක්‍රීඩා සඳහා යොමුව සිටීම නව ගැටළු රැසක ඇරඹුමකි. බාල තරුණ මහළු සැමට ක්‍රීඩාවෙ වැදගත්කම මීට වඩා අවධාරණයෙන් යුතුව කියා දීමේ කාලය එළඹ ඇත.

II. පරිසර දූෂණය මානවයාගේ අනාගතය අඳුරු යුගයකට රැගෙන යමින් පවතී. විද්‍යුත් අපද්‍රව්‍ය ප්ලාස්ටික් හා පොලිතීන් භූමිය මත ගොඩ ගැසීම මෙහිලා මතුව ඇති ප්‍රමුඛ පෙළේ ගැටළුවකි. සමස්ත සත්ව වගර්යා විෂයෙහිම මෙහි බලපෑම සුළුපටු නොවන අතර මුහුදු ජීවීන් හටද මෙය ප්‍රබල තර්ජනයක්ව පවතී. ගැටළු සහිත භාණ්ඩ භාවිතයෙන් වැළකීම, භාවිතය අවම කිරීම හා විකල්ප විසඳුම් වෙත යොමුවීමට කාලය එළඹ ඇත. එසේ නොවෙන්නේ නම් සොබා දහම දෙන දඬුවම් විඳීමට අපට සිදුවන කාලය වැඩි ඈතක නොවේ.

III. සෑම වසරකදීම ලෝකයේ ස්වාභාවික විපත් වලින් ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වෙයි. ගං වතුර, සුනාමි, සුළි සුළං, කුණාටු, ගිනි කඳු පිපිරීම්, භූ චලන මෙම විපත් අතරින් කිහිපයකි. නිතර නිතර මෙවැනි තත්වයන්ට මුහුණ දීමෙන් ජීවිත හා දේපල හානි හේතුකොටගෙන රටක ස්වයංවර්ධන ක්‍රියාවලින්ට බාධා ඇති කරයි. මිනිස් ක්‍රියාකාරකම්ද ඇතැම් විපත් සඳහා වක්‍රව බලපාන බව පෙනීයයි. දූරදශර්යීව කටයුතු කිරීමෙන් හා ආපදා කළමනාකරණය කීමෙන් හානිය අවම කරගත හැකිවේ.

IV. ජනමාධ්‍යයේ හැසිරීම අද වන විට ඉතා ප්‍රබල තත්වයකට පැමිණ තිබේ. සමාජ ආර්ථික, දේශපාලනික, ආගමික, අධ්‍යාපනික මෙන්ම සංස්කෘතික පරිසරයට එමගින් ඇතිකරන බලපෑම යහපත් මෙන්ම අයහපත් වන අවස්ථාද වෙයි. ගුණාත්මක බවින් ඉහළ මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍ය වේ. නැතිනම් ජනමාධ්‍ය වලට අවැසි ලෙස සමාජය හා මිනිස් ජීවිත වෙනස් කිරීම අනාගතයේ ගැටළු රැසකට මූල පාදයි. නිමර්ාණ ශීලීත්වය හා රසවින්දනය මොටකිරීමද මේ සමගම වර්ධනය වන බැව් දක්නට ලැබේ.

(03) පහත දක්වෙන ඡේදය කියවා වචන 50-60 ත් වනසේ සාරාංශ කර ලියන්න. ඔබේ පිළිතුරේ වචන සංඛ්‍යාව පහතින් සඳහන් කරන්න.

එක් එක් භාෂාවට සුවිශේෂ වූ සාහිත්‍යයක් ද බොහෝ විට ඇති බව අපි දනිමු. ඇතැම් භාෂාවකට සාහිත්‍යයක් නොමැති විය හැකි වුවද බොහෝ භාෂා වලින් ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථ ඇත්තේය. මේ අතර කාව්‍යයට ද විශේෂ තැනක් හිමි වෙයි. මේ කාව්‍යයන් නිර්මාණය කර ඇත්තේ ඒ ඒ කාලවල විසූ උගතුන් විසිනි. උදාහරණ වශයෙන් කව්සිළුමිණ ගුත්තිල කාව්‍යය, සැළලිහිණි සංදේශය ආදී කෘතීන් දැක්විය හැකි ය. මේ එක් එක් කාව්‍යය කිසියම් අවධියක කිසියම් එක් ලේඛකයෙකු විසින් රචනා කරන ලද බවට සැකයක් නැත. සැළලිහිණි සංදේශය ජයවර්ධනපුර කෝට්ටේ විසූ රාහුල හිමියන් ලියූ කෘතියකි.

උගතුන් විසින් සම්පාදනය කරනු ලැබූ මෙවැනි කෘති වලට අමතරව, ජනතාව අතරේ ම ඇති වී ජනතාව අතරේ ම ආරක්ෂා වී එන තවත් කාව්‍ය වර්ගයක් ද ඇත. ඒවා සාමාන්‍යයෙන් ජනකවි නමින් හැඳින් වේ. මේ අනුව ජනකවි ගැන කරුණු දෙකක් දැක්විය හැකියි. උගත් සාහිත්‍යයක් ඇතත් නැතත් එනෑම ජන කොටසක් අතර ජනකවි පහළ විය හැකි ය. පහළවන බව පළමු වන කරුණය. දෙවැන්න නම් උගත් සාහිත්‍යයක් පහළ වීමට පෙරාතුව ජනකවි පහළ වීම ස්වාභාවික බව ය. ලෝකයේ ඕනෑම භාෂාවක් හා සාහිත්‍යයක් ගෙන බැලුව ද උගත් කවීන් කවි ලිවීමට පෙර පටන් පැවැත එන ජනකවි සාහිත්‍යයක් ඇති බව පිළිගත් මතයකි.

(ලකුණු 10)

(04) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

ලොව මෙසේ ප්‍රචලිත වූ කෙටිකතාව සිංහල සාහිත්‍යයට ප්‍රවේශ වූයේ විසිවන සියවසේ මුල් භාගයේ දී ය. පැරණි කතා කලාවෙන් ක්‍රම විකාශිත විශ්ව කෙටිකතාවේ නිර්මාතෘ සෙවීම දුෂ්කර කටයුත්තක් වන්නා සේ ම සිංහල කෙටි කතාවේ නිර්මාතෘ සෙවීම ද දුෂ්කර කටයුත්තක් වන්නේය. එයට හේතුව සිංහලයෙහි අනාදිමත් කාලයක සිට සංවර්ධිත කතා කලාවක් බිහිවීමත්, සිංහල කෙටිකතාව එහි විකාශයක් ලකුණු පළ කිරීමක් ය. ජන කතා, සද්ධර්මාරත්නාවලී කතා, සද්ධර්මාලංකාර කතා ආදී සිංහල කතා ඇසුරේම උපත් නවා වූ කතා ක්‍රමයක් ලෙස ඇතැම්හු සිංහල කෙටි කතාව දකිති. සිංහලයෙහි පළ වූ ප්‍රථම කෙටිකතා සංග්‍රහය ලෙස දැනට පිළිගැනෙනුයේ 1924 දී පළ වූ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ගැහැනියක් " කෙටිකතා සංග්‍රහයයි. එච්. ඒ. සිල්වාගේ කතාවන්හි ද කෙටිකතා ලක්ෂණ දක්නට ලැබෙතුදු ඔහුගේ මුල් ම කෙටිකතා සංග්‍රහය වූ "දෙයියන්ගේ රටේ " පළව ඇත්තේ 1927 දී ය.

(i) කෙටිකතාව සිංහල සාහිත්‍යයට ප්‍රවේශ වූයේ කුමන කාලයේද?

............................................................................................................

............................................................................................................

(ii) සිංහල කෙටි කතාවේ නිර්මාතෘ සෙවීම දුෂ්කර වන්නේ ඇයි?

............................................................................................................

............................................................................................................

(iii) සිංහල කෙටි කතාව නවා වූ කතා ක්‍රමයක් ලෙස ඇතැමුන් හඳුන්වන්නේ කුමක් නිසාද?

............................................................................................................

............................................................................................................

(iv) පළමු සිංහල කෙටි කතාව පළ වූ වර්ෂය හා එම කෙටිකතා සංග්‍රහය කුමක් ද?

............................................................................................................

............................................................................................................

(v) පළමු කෙටිකතා සංග්‍රහය රචනා කළේ කවුරුන්ද?

............................................................................................................

............................................................................................................

(ලකුණු 2x5-10)

(05)

ශ්‍රී ලාංකේය සංගීත ක්ෂේත්‍රයට මහඟු සේවයක් ඉටු කළ හෙළයේ මහා ගාන්ධාර්වයා වන පණ්ඩිත් ඩබ්ලිව් ඩී. අමරදේව මහතාගේ ගුණ සමරු උළෙල නාමල්ගම මහා විද්‍යාලයේ 2020.03.22 දින පෙ.ව. 10.00ට පැවැත්වීමට පාසලේ සෞන්දර්ය අංශය කටයුතු සංවිධානය කරයි. ඒ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගි වේ. මේ සඳහා සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.

නැතහොත්

අධික වර්ෂාව නිසා ඩෙංගු රෝගය යළි හිස ඔසවා ඇත. ඔබේ පාසලේ සිසුන් කිහිප දෙනෙකු ද මේ වන විට ඩෙංගු රෝගය නිසා රෝහල්ගතව ඇත. ඩෙංගු රෝගය මදර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට පැමිණෙන ලෙස දන්වා යවන ලිපිය සකස් කරන්න. (ඔබ විද්‍යාලයීය ශිෂ්‍ය සමිතියේ ලේකම් යැයි සිතන්න. දිනය, වේලාව අභිමත පරිදි යොදාගන්න.)

(ලකුණු 15)

1



# පළමු වාර පරීක්ෂණය
# 2024

2024.06.

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

කාලය පැය 2 යි

නම .................................... පන්තිය ........................ අංකය ............

වැදගත් :
- ✳ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ✳ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.

**1 සිට 10 තෙක් ඇති සියලු අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න.**

1.(අ) ජාතක කතා පොත සම්පාදනය සඳහා මූලාශ්‍ර කොටගත් ග්‍රන්ථය කුමක්ද?

.....................................................................................................

(ආ) ජාතක කතා පොත ඇසුරින් බිහිවී ඇති සිව්පද කාව්‍ය ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

.....................................................................................................

2. "ශිවිස්නා ලද යැදේවයෙනි"

(අ) මේ කා විසින් කාහට කරන ලද ප්‍රකාශයක්ද?

.....................................................................................................

(ආ) මෙය කුමක් අරභයා ප්‍රකාශ කරන ලද්දක්ද?

.....................................................................................................

3. "සිංහයෙකු විසින් රක්නා රන් ගල්ගුහාවක් පරිද්දෙන්"

(අ) මෙහි සිංහයෙකු විසින් රක්නා රන් ගල්ගුහාවට සමාන කර ඉදිරිපත් කරන්නේ කුමක්ද ?

.....................................................................................................

(ආ) මෙම උපුටනය ඇතුළත් මුල් කෘතිය කවර යුගයකදී රචනා කරන ලද්දක්ද?

.....................................................................................................

4. (අ) සිංහල පන්සිය පනස් ජාතක කතා පොතේ ආකෘතික ලක්ෂණ තුන නම් කරන්න.

.....................................................................................................

(ආ) සිංහල කෘතියේ දක්නට නොලැබෙන ආකෘතිකාංග දෙක කුමක්ද?

.....................................................................................................

5. "රජ්ජුරුවන්ට පටහැනි වීම නම් යුක්ත නොවෙයි"

(අ) මෙලෙස සිතන්නේ කවුරුන්ද?

..............................................................................................

(ආ) මෙය නිර් මාණයේ කවර කොටසකින් උපුටා ගන්නා ලද්දක්ද?

..............................................................................................

6."නොදැනම තමා බල _ සබයට අවුත් නොපැකිල "

(අ) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

..............................................................................................

(ආ) මෙම පද්‍ය කවර වීරිතකින් රචනා වූවක්ද ?

..............................................................................................

7. (අ) ගුත්තිල කාව්‍ය රචනාවූ යුගය දක්වා එවකට රාජ්‍ය පාලකයා නම් කරන්න.

..............................................................................................

(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුරුන්ද?

..............................................................................................

8. "දෙදෙනම ඉඳ දෙපිට සව් සත සතන් තුටු කොට"

(අ) මෙම පද්‍ය කොටසින් දැක්වෙන අලංකාරෝක්තීන් දෙකක් දක්වන්න.

..............................................................................................

(ආ) මෙය කාගේ රචනයක්ද?

..............................................................................................

9. "සුර ගඳබුන් ලෙසට - පටන්ගෙන වෙණ ගායනාවට"

(අ) පද්‍යයේ දක්නට ලැබෙන උපමාව , උපමේය බෙදා දක්වන්න .

..............................................................................................

(ආ) මෙම නිර් මානයේ තේමාව කුමක්ද?

..............................................................................................

10. (අ) ගුත්තිල පණ්ඩිතයන් ජය ගන්නේ සක්‍ර දෙවියන්ගේ උපකාරයෙන් බව කියවෙන කවියක් උපුටා දක්වන්න.

..............................................................................................

..............................................................................................

(ආ) ගුත්තිල කාව්‍ය රචනා වූ යුගයේ විසූ වෙනත් රචකයෙකු නම් කරන්න.

..............................................................................................

2024-06

**2.*පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය කොටස් ඇසුරෙන් කෙටි පිළිතුරු සපයන්න .**

**1. "කැරමිණි බරණැරුස් - රසින් සුරසැවූ සුවහස්**

**සුරන් සහ සහසැස් - නොකැරසිටියේ අහස් කුස හිස්"**

ඉරි ඇඳි පදවල අර්ථය ලියා දක්වන්න.

......................................................................................................

සමස්ත කවියේ අර්ථය සරලව ඉදිරිපත් කරන්න.

......................................................................................................

......................................................................................................

**2. "යස දිගත ඇන්දේ - විජය සිරිසඳ ගෙනවුලැන්දේ"**

ඉරියැදි පද දෙකේ අර්ථය ලියා දක්වන්න.

......................................................................................................

මෙම කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.

......................................................................................................

......................................................................................................

**3."නඳුන් උයන මෙන් සරහන ලද උයනට වැද නගනලද දළපුබු පෙසත් ඇති එක්සියයක් රාජාසන ආදී වූ පිළියෙල කොට තබන ලද ශ්‍රී විභූතියෙන් දැක"**

ඉරි ඇඳි පදවල අර්ථය ලියා දක්වන්න.

......................................................................................................

මෙහි දැක්වෙන උපමාව හා උපමේය වෙන් කර දක්වන්න.

......................................................................................................

......................................................................................................

**4."මියුලු නුවර ගොස් වේදිහ රජ්ජුරුවන්ගේ ඉස කල්පැන් පළක් මධනාසේ කඩුවෙන් කපා පියා දෙපයින් මැඩගෙන හිඳී ජය පානය බොමහ"**

ඉරි ඇඳි පදවල අර්ථය ලියා දක්වන්න.

......................................................................................................

මෙම ප්‍රකාශය කිරීමට බලපෑහේතුව කෙටියෙන් දක්වන්න.

......................................................................................................

......................................................................................................

......................................................................................................

**5."මස් අවුළු ආදියත් කෑ නොදෙම හැයි වාසි බෙනෙමින් යමුගුරු බාලා සියලු රා මස් පිරූ සැලවල් බිඳ"**

ඉරි ඇඳි පදවල අර්ථය ලියා දක්වන්න.

......................................................................................................

......................................................................................................

මෙය කා විසින් කා හට කරන ලද ප්‍රකාශයක්ද?

......................................................................................................

**3 සහ 4 ප්‍රශ්න අනිවාර්ය වන අතර 5,6,7, ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

3.උම්මග්ග ජාතකය රසවත් කිරීමට රචකයා භාවිතා කළ
(1)අවස්ථාවෝචිත උපමා භාවිතයේ අපූර්වත්වයත්
(11)නාට්‍යමය රසය දක්වන සංවාදාත්මක භාෂා ලක්ෂණත්
එක් කොටසකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

4.ගුත්තිල කාව්‍ය සාර්තක වීමට බලපා ඇත්තේ වෑත්තෑවේ හිමියන්ගේ
(1) වියත් වහර භාවිතයත්
(11) කට වහරට ආසන්න සරල වහර භාවිතයත් හේතුවෙනි
එක් කොටසකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

5.කේවට්ට බමුණාගේ චරිතයෙන් විටකදී සටකපට ආත්මාර්ථකාමී චරිත ලක්ෂණත් විටෙකදී තම රජුට පක්ෂපාතී බුද්ධිමත් උපදේශකයෙකුගේ චරිත ලක්ෂණත් මතුකරයි නිදසුන් තුනක් ඇසුරින් පහදන්න.

6. ගුත්තිල කාව්‍ය රසවත් කිරීමට රචකයා භාවිතා කළ අලංකාරෝක්තීන්හි අපූර්වත්වය නිදසුන් තුනක් ඇසුරින් පහදන්න.

7.උම්මග්ග ජාතකයෙන් හමුවන මහෞෂධ පණ්ඩිතයන් පරාර්ථකාමී බුද්ධිමත් රාජ්‍ය උපදේශකවරයෙකි නිදසුන් තුනක් ඇසුරින් පහදන්න.